**ශීර්ෂය 246 - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 246 - දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 සැප්තැම්බර් 22 දින දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 4,476.05 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 4,437.13 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 38.92 ක් හෙවත් සියයට 0.87 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලයන | |
| පුනරාවර්තන | 2,440.00 | 2,428.41 | 11.59 | 0.48 |
| මූලධන | 2,036.05 | 2,008.72 | 27.33 | 1.34 |
| **එකතුව** | **4,476.05** | **4,437.13** | **38.92** | **0.87** |

## 2.2 ආදායම් ගිණුම්

--------------------

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම්**

----------------------------------------

දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා ආදායම් සංකේත 29 ක් සඳහා එකතුව රු.මිලියන 537,050.00 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර ඉන් එකතුව රු.මිලියන 524.83 ක ආදායමක් සමාලෝචිත වර්ෂයේදී රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | මුල් ආදායම් ඇස්තමේන්තු ගත ආදායම | සංශෝධිත ඇස්තමේන්තු ගත ආදායම | තථ්‍ය ආදායම | සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම අතර විචලනය වැඩිවීම/(අඩුවීම) | වැඩිවීම/ (අඩුවීම) සංශෝධිත ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | රු.මලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 10.02.01.01 | 35,000.00 | 30,000.00 | 27,896.35 | (2,103.65) | (7.0) |
| 10.02.01.02 | 85,000.00 | 75,000.00 | 73,719.68 | (1,280.32) | (1.7) |
| 10.02.01.03 | 40,000.00 | 35,000.00 | 28,894.52 | (6,105.48) | (17.4) |
| 10.02.01.04 | 136,000.00 | 90,000.00 | 83,726.43 | (6,273.57) | (6.9) |
| 10.02.02.01 | - | - | 0.62 | 0.62 | 100.0 |
| 10.02.02.02 | - | - | 0.26 | 0.26 | 100.0 |
| 10.02.02.03 | - | - | 0.0 | 00 | 100.0 |
| 10.02.03.01 | - | - | 11.63 | 11.63 | 100.0 |
| 10.02.03.02 | - | - | - | - | - |
| 10.02.03.03 | - | - | - | - | - |
| 10.02.08.00 | - | - | - | - | - |
| 10.02.09.00 | - | - | 15.77 | 15.77 | 100.0 |
| 10.03.03.00 | 8,000.00 | 2,200.00 | 831.92 | (1,368.08) | (62.2) |
| 10.03.04.00 | 2,500.00 | 2,300.00 | 1,394.92 | (905.08) | (39.4) |
| 10.03.05.00 | 1,300.00 | 1,200.00 | 753.31 | (446.69) | (39.4) |
| 10.02.12.01 | 22,000.00 | 20,000.00 | 21,243.98 | 1,243.98 | 6.2 |
| 10.02.12.02 | 10,600.00 | 10,000.00 | 6,800.01 | (3,199.99) | (32.0) |
| 10.02.12.03 | 18,000.00 | 18,000.00 | 15,894.77 | (2,105.23) | (11.7) |
| 10.04.01.02 | 15,000,00 | 11,000.00 | 12,339.85 | 1,339.85 | 12.2 |
| 10.04.04.00 | 8,000.00 | 6,500.00 | 6,148.45 | (351.55) | (5.4) |
| 10.04.01.01 | 145,000.00 | 130,000.00 | 139,395.47 | 9,395.47 | 7.2 |
| 10.04.02.01 | 32,000.00 | 24,000.00 | 26,205.53 | 2,205.53 | 9.2 |
| 10.04.03.01 | 95,000.00 | 64,000.00 | 62,411.59 | (1,588.41) | (2.5) |
| 10.04.03.99 | 500.00 | 300.00 | 492.47 | 192.47 | 64.2 |
| 10.02.01.02 | 15,000.00 | 14,800.00 | 11,454.39 | (3,345.61) | (22.6) |
| 10.04.01.03 | 100.00 | 2,000.00 | 4,135.64 | 2,135.64 | 106.8 |
| 10.06.03.00 | - | - | - | - | - |
| 10.03.09.00 | 1,000.00 | 750.00 | 1,066.64 | 316.64 | 42.2 |
| 10.02.07.00 | - | - | - | - | - |
| එකතුව | **670,000.00** | **537,050.00** | **524,834.20** | **(12,215.80)** | **(2.27)** |

## 2.3 අත්තිකාරම් ගිණුම

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 24601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 105.00 | 82.07 | 60.00 | 78.15 | 360.00 | 321.37 |

## 2.4 අග්‍රිම ගිණුම්

දෙපාර්තමේන්තුව යටතේ වන අංක 7002/0000/00/0069/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 522.79 ක් විය.

## 2.5 පොදු තැන්පත් ගිණුම්

දෙපාර්තමේන්තුව යටතේ තැන්පත් ගිණුම් 07 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 1,035.73 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු.මිලියන** |
| 6000/0000/00/0001/0039/000 | 0.45 |
| 6000/0000/00/0002/0052/000 | 0.60 |
| 6000/0000/00/0006/0085/000 | 12.56 |
| 6000/0000/00/0016/0004/000 | 56.45 |
| 6000/0000/00/0018/0005/000 | 0.14 |
| 6000/0000/00/0019/0010/000 | 0.03 |
| 6000/0000/00/0014/0003/000 | 965.50 |
| **එකතුව** | **1,035.73** |

## 2.6 විගණන නිරීක්ෂණය

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් සහ සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 අග්‍රිම ගිණුම

2013 හා 2014 වර්ෂවල සිට පැවැත එමින් තිබුණු පිළිවෙලින් රු.මිලියන 1.40 ක් හා රු.මිලියන 1.44 ක් වශයෙන් වූ එකතුව රු.මිලියන 2.84 ක අග්‍රිම ශේෂ 2016 අප්‍රේල් 30 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

### 3.2 පොදු තැන්පත් ගිණුම

දේශීය ආදායම් ගොඩනැගිල්ල නවීකරණ කිරීමේ කොන්ත්‍රාත්තුව 2009 වර්ෂයේදී රාජ්‍ය සංස්ථාවකට ලබා දී තිබුණි. එම කොන්ත්‍රාත්තුව ප්‍රමාද කර නිම කිරීම නිසා 2015 වර්ෂයේදී අය කළ රු.1,341,448 ක ප්‍රමාද ගාස්තු රජයේ ආදායමට බැර නොකර 2016 අප්‍රේල් 30 දින වන විටත් තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

### 3.3 ආදායම් ගිණුම්

දෙපාර්තමේන්තු ප්‍රධානියාට ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් ආදායම් සංකේත 29 ක ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවරී තිබුණි. එම ආදායම් සංකේතවලට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ රැස්කිරීමට අපේක්ෂිත ආදායම ලෙස රු.මිලියන 670,000 ක් ලෙස මූලික ඇස්තමේන්තුවල දක්වා තිබුණත්, එම ආදායම රැස්කිරීම වෙනුවට රැස්කර ගත හැකි ආදායමට අනුරූප වන පරිදි මූලික ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 537,050 ක් ලෙස සංශෝධනය කර තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ හිඟ බදු වාර්තාව පරීක්ෂා කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) හිඟ ආදායම් වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය අවසානයට රු. මිලියන 259,528 ක ආදායම් හිඟහිටිව පැවැතුණි. ආදායම් ගිණුම් 29 හි ඩී.ජී.එස්.ජ්. ආදායම් -2 ආකෘතියේ අනු අංක 8 සිට 14 දක්වා හිඟ ආදායම් පිළිබඳ විස්තර කිසිවක් දක්වා නොතිබුණි. එම හිඟ බදු හා දඩ මුදලින් රු. මිලියන 33,723 ක් එනම්, මුළු හිඟයෙන් සියයට 13 ක් පමණක් අයකර ගත හැකි බවත් ඉතිරි රු. මිලියන 225,805 ක් එනම් මුළු හිඟයෙන් සියයට 87 ක් වන හිඟ බදු හා දඩ මුදල් අයකිරීම තාවකාලිකව අත්හිටුවා ඇති බව වාර්තා කර තිබුණි. එසේ අයකිරීම් තාවකාලිකව අත්හිටුවීමට බලපෑ හේතූන් හා හිඟහිටි බදු ශේෂ කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අයකිරීම් තාවකාලිකව අත් හිටුවීමට බලපෑ හේතූන් | හිඟ බදු ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| බදු අභියාචනා | 89,737 |
| විරෝධතා දැක්වීම් | 18,292 |
| පරිගණක පද්ධති දෝෂ ලෙස දැක්වීම | 18,683 |
| ආපසු ගෙවිය යුතු ශේෂ පැවතීම | 12,686 |
| අධිකරණ ක්‍රියා මාර්ග ගෙන තිබීම | 2,235 |

(ii) හිඟ බදු වාර්තාවට අදාළ කේවල ශේෂ ලැයිස්තුව පරීක්ෂා කිරීමේදී බදුකරු විසින් ස්වතක්සේරු පදනම මත ගෙවීමට එකඟවී තිබුණු බදු මුදල් සම්බන්ධයෙන් බදුකරු විසින්ම විරෝධතාවය දක්වා තිබීම හේතුවෙන් එකතු කිරීමේ අගය මත බදු, ආදායම් බදු හා ජාතිය ගොඩනැගීමේ බදු යන බදු වර්ග 03 ට අදාළ රු. මිලියන 3,885.86 ක් අයකර ගැනීම තාවකාලිකව අත්හිටුවා තිබුණි.

පැහැර හරින ලද බද්දක් අයකර ගැනීමට කටයුතු කිරීමට පෙර 2002 අංක 14 දරන එකතුකළ අගය මත බදු පනතේ 41(1) වගන්තිය ප්‍රකාරව බදුකරු වෙත ලිඛිතව දැනුම් දිය යුතු අතර වලංගු අභියාචනයක් ඉදිරිපත් කර නොමැති නම්, මෙම අය කර ගැනීම සම්බන්ධව විරෝධතාවයක් ඉදිරිපත් කිරීමට පනතේ 41(2) වගන්තිය අනුව බදුකරුට හැකියාව ඇත. එහෙත් එම විරෝධතා සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් අවසාන තීරණයක් ලබා දිය යුතු අතර, එවැනි තීරණයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් ලබා දීම හෝ හිඟ ශේෂ අය කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් උක්ත රු.මිලියන 3,885.86 ක හිඟ බදු ශේෂය 2015 දෙසැම්බර් 31 දිනටත් නිරවුල් කර නොතිබුණි.

(iii) භාණ්ඩ හා සේවා මත හිඟ බදු රු.මිලියන 1,966 ක් සඳහා කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර එම හිඟ බදු ශේෂය සඳහා විස්තර ලේඛනගත කර නොතිබුණි.

(iv) අවලංගු කරන ලද බදු පනත් 08 කට අදාළව සමාලෝචිත වර්ෂය ආරම්භයේදී රු. මිලියන 8,694 ක හිඟ ශේෂයක් පැවති අතර එමගින් රු.මිලියන 8,134 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කර නොතිබුණි.

(v) අමාත්‍යාංශ උපදේශන කමිටුව විසින් රාජ්‍ය ආයතනවලින් අයවිය යුතු හිඟ බදු අයකර ගැනීම සඳහා අසාමාන්‍ය කාල සීමාවක් ලබාදී තිබුණි. නිදසුනක් වශයෙන් එක් රාජ්‍ය ආයතනයක හිඟ බදු මුදල මාසික වාරික 1,965 කින් එනම්, වර්ෂ 163 කින් ගෙවා නිම කිරීමට අවසර දී තිබුණි.

(ඇ) අංක 10.02.01.00 ආදායම් සංකේතය යටතේ එකතු කිරීමේ අගය මත බදු පාලන ගිණුමේ භාණ්ඩාගාර පොත් අනුව ආදායමට වඩා දෙපාර්තමේන්තු පොත් අනුව ආදායම රු.මිලියන 203.70 කින් වැඩියෙන් දක්වා තිබුණි. එම වෙනසට අදාළ හේතු හඳුනාගැනීමට කටයුතු කිරීමෙන් තොරව එම මුදල 10.02.01.02 දරන ආදායම් සංකේතය යටතේ වන ආදායමින් ආපසු ගෙවීම් ලෙස (Refund) අඩු කර දක්වා තිබුණ අතර ඉකුත් වර්ෂයේදී එලෙස අඩුකරන ලද මුදල රු.මිලියන 12.36 ක් විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා 2015 අංක 10 දරන මුදල් පනත මඟින් සුපිරි වාසි බද්ද, කැසිනෝ කර්මාන්ත අය බද්ද, මන්දිර බද්ද හා විගමන බද්ද යන නව බදු ආදායම් 04 ක් රැස්කිරීම සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට පවරා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී සුපිරි වාසි බද්දෙන් රු.මිලියන 47,360.61 ක් එකතු කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණද, අනෙකුත් බදු වර්ග 03 ට අදාළ කාර්යසාධනය පහත පරිදි විය.

(i) 2015 ජනවාරි 29 දින සිට බලපැවැත්වෙන පරිදි එදිනට ලියාපදිංචි වී සිටි කැසිනෝ ව්‍යාපාර 04 කින් එක් අයෙකුගෙන් රු. මිලියන 1,000 බැගින් එකතුව රු. මිලියන 4,000 ක කැසිනෝ කර්මාන්ත අය බදු රැස්කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී ඉන් රු.මිලියන 80 ක් පමණක් රැස්කර තිබුණි.

(ii) 2015 අප්‍රේල් 01 දින හෝ එදිනෙන් පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහාම 2000 අප්‍රේල් 01 දින හෝ ඉන් පසුව ඉදිකරන ලද මන්දිරයක සෑම අයිතිකරුවකුගෙන්ම රු. මිලියන එකක මන්දිර බද්දක් අයකළ යුතු වුවත්, පනතේ 25(4) උපවගන්තිය ප්‍රකාරව, පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අදාළ නියෝග සකස් කර නොමැති බැවින් සමාලෝචිත වර්ෂයේදී අයවීම් කිසිවක් සිදු කර නොතිබුණි.

(iii) 2015 නොවැම්බර් 01 දින සිට බල පැවැත්වෙන පරිදි ස්ථිරවම දිවයින හැරයන සෑම ශ්‍රී ලාංකික පුරවැසියෙකුගෙන්ම එම පුරවැසියාට රටින් පිටතට ගෙනයාම සඳහා නිදහස් කරන ලද විදේශ විනිමය මත සියයට විස්සක අනුප්‍රමාණයකට විගමන බද්දක් අය කිරීමේ විධිවිධාන පනවා තිබුණත්, එය ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී කිසිදු ආදායමක් රැස් කර නොතිබුණි.

## 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳීම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 සැප්තැම්බර් 18 දින මියගිය නිලධාරිනියකගේ රු.191,514 ක් වූ දේපල ණය ශේෂය සඳහා අග්‍රාහාර ණය සුරකුම් රක්ෂණ ආවරණය ලබා දී තිබුණද, එම ණය මුදල් ජාතික රක්ෂණ භාර අරමුදලෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සේවය හැරගිය නිලධාරීන් 05 දෙනෙකුගෙන් අය විය යුතු රු. 355,420 ක් වූ ණය ශේෂ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) 1999 වර්ෂයේදී සේවය හැර ගිය සේවකයෙකුගෙන් අයවියයුතු රු.252,045 ක් වූ දේපල ණය මුදල ඔහු සේවයේ යෙදී සිටියදී තම නමට ඉඩමේ ඔප්පුව ලිවීමට කටයුතු කර නොතිබුණු බැවින් එම ණය ශේෂය අය කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට වර්ෂ 20 ක් ඉක්මවා තිබුණු රු.230,534 ක් වූ හිඟහිටි ණය ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.5 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කරන ලද 2015 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධිත ඇස්තමේන්තුව අනුව යාවත්කාලීන කර නොතිබුණි. ඊට අමතරව, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක්ද පිළියෙල කර නොතිබුණි.

## 3.6 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) **නිෂ්ක්‍රීය වත්කම්**

පහත විග්‍රහ කර ඇති වත්කම් නිෂ්ක්‍රීයව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවැති කාලය |
|---|---|---|
| ට්‍රාන්ස්ෆෝමර් යන්ත්‍ර | 02 | 2009 වර්ෂයේ සිට විගණන දිනය වූ 2016 ජුනි 13 දින දක්වා (දේශීය ආදායම් ගොඩනැගිල්ල නවීකරණයේදී සපයා තිබුණි.) |
| සී.සී.ටී.වී.කැමරා | 70 | 2010 වර්ෂයේ සිට විගණන දිනය වූ 2016 ජුනි 13 දක්වා (දේශීය ආදායම් ගොඩනැගිල්ල නවීකරණයේ දී ගොඩනැගිල්ලේ මහල්වලට සවිකර ඇති නමුත් ඒවා භාවිතයට ගෙන නොතිබුණි.) |

(ආ) **ලැබිය යුතු ශේෂ**

රාජ්‍ය සංස්ථාවකට අයත් ඉඩමක පර්චස් 100 ක ඉඩම් කොටසක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පවරා ගැනීම සඳහා 2008 පෙබරවාරි 28 දින රු. මිලියන 50 ක් අත්තිකාරම් වශයෙන් එම සංස්ථාවට ගෙවා තිබුණි. එහෙත් පසුව එම දේපල පවරා ගැනීම අත්හැර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ගෙවා තිබුණු අත්තිකාරම් ආපසු අයකරගෙන නොතිබුණි.

## 3.7 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

දේශීය ආදායම් ගොඩනැගිල්ල නවීකරණයට හා මහල් නවයකින් සමන්විත රථ වාහන අංගනය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු කළ රු.මිලියන 1,437 කින් රාජ්‍ය සංස්ථාවකට රු.මිලියන 1,318 ක් ගෙවා තිබුණි. 2014 දෙසැම්බර් 31 දිනට පෙර එම ඉදිකිරීම් අවසන් කළ යුතුව තිබුණත්, 2016 ජුනි 30 දින වන විටත් අවසන් කර නොතිබුණි. රාජ්‍ය සංස්ථාවට ගෙවීම් කර වර්ෂ 06 ක් ගත වී තිබුණත්, එදිනට එහි ඉදිකිරීම්වල ප්‍රගතිය සියයට 80 ක් වී තිබුණි.

## 3.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

බදු ගෙවන්නන් වෙනුවෙන් නිෂ්කාශණ සහතික නිකුත් කිරීම සඳහා දෙපාර්තමේන්තුවට එම බදු ගෙවන්නන්ගෙන් අයවීමට හිඟ බදු නොතිබිය යුතුය. එහෙත්, බදු ලිපිගොනුවකට අදාළව 2015 ඔක්තෝබර් 08 දින බදු නිෂ්කාශන සහතික නිකුත් කර තිබුණ ද, එදිනට එම බදු කරුගෙන් අය විය යුතු හිඟ බදු ශේෂය රු.මිලියන 132.33 ක් වී තිබුණි. තවද, එම හිඟ බදු 2016 මාර්තු 21 දිනට පෙර ගෙවා නිම කිරීම සඳහා මාසිකව ගෙවීම් වැඩපිළිවෙලක් සකස් කර තිබුණ ද, විගණන දිනය වූ 2016 මාර්තු 21 දින වන විටත් ඉන් රු.මිලියන 113.83 ක් තව දුරටත් අයවීමට තිබුණි.

## 3.9 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයට අදාළ අයවැය යෝජනා අනුව, එතෙක් පැවති එකතු කළ අගය මත බදු අය කළ හැකි සීමාව වන කාර්තුවකට රු.මිලියන 3 හෝ වර්ෂයකට රු. මිලියන 12, 2013 ජනවාරි 01 දින සිට, කාර්තුවකට රු.මිලියන 3.75 හෝ වර්ෂයකට රු.මිලියන 15 ක් දක්වා ඉහළ දමා තිබුණි. මෙම බදු සීමාව ඉහළ දැමීමත් සමඟ බදුකරුවන් 17,000 කට අධික සංඛ්‍යාවක් බදු පැහැදමින් ඉවත් කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව කටයුතු කර එම බදු ලිපිගොනු තාවකාලිකව අක්‍රිය කර තිබුණි. එම බදුකරුවන්ගේ ලියාපදිංචිය අවලංගු කර ඒ වන විට නිකුත් කර තිබුණු එකතු කිරීමේ අගය මත බදු ලියාපදිංචි සහතික දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ආපසු ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි එසේ අක්‍රිය කළ බදුකරුවන් 54 දෙනෙකු රාජ්‍ය ආයතනවලින් රු.මිලියන 175.09 ක පමණ එකතුකළ අගය මත බදු රැස්කර තිබුණද, බදු වාර්තා ඉදිරිපත් කිරීමක් හෝ දෙපාර්තමේන්තුව වෙත බදු මුදල් ප්‍රේෂණය කිරීමක් හෝ සිදු කර නොතිබුණි. එවැනි බදුකරුවන් සම්බන්ධයෙන් පනතේ 17(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර තිබුණු බව විගණනයේදී තහවුරු වී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේදී දෙපාර්තමේන්තුව රැස් කළ ආදායමෙන් [ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව විසින් රැස්කළ ආනයන මත එකතුකළ අගය මත බදු (ආනයන) හා ජාතිය ගොඩනැගීමේ බදු (ආනයන) ආදායම හැර)] සියයට 97 ක් ප්‍රධාන කාර්යාලය විසින්ද, සියයට 3 ක් ප්‍රාදේශීය කාර්යාල විසින්ද රැස්කර තිබුණි. නමුත් දේශීය ආදායම් සේවයේ නිලධාරීන් අනුයුක්ත කිරීමේදී සමාලෝචිත වර්ෂයේදී මුළු නිලධාරීන් සංඛ්‍යාවෙන් සියයට 52 ක් ප්‍රධාන කාර්යාලය සඳහාද, සියයට 48 ක් ප්‍රාදේශීය කාර්යාලවලටද අනුයුක්ත කර තිබුණි. එසේම ඉකුත් වර්ෂයේදී පිළිවෙලින් සියයට 59 ක් හා සියයට 41 ක් වශයෙන් නිලධාරීන් අනුයුක්ත කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| විස්තරය | 2015 | | 2014 | |
|---|---|---|---|---|
| | ප්‍රධාන කාර්යාලය | ප්‍රාදේශීය කාර්යාලය | ප්‍රධාන කාර්යාලය | ප්‍රාදේශීය කාර්යාල |
| **ශුද්ධ ආදායම් රැස් කිරීම** | | | | |
| රු.මිලියන | 410,971 | 14,243 | 354,853 | 12,165 |
| ප්‍රතිශතය | 97 | 03 | 97 | 03 |
| **දේශීය ආදායම් සේවයේ නිලධාරීන් අනුයුක්ත කිරීම** | | | | |
| - සංඛ්‍යාව | 450 | 409 | 558 | 392 |
| - ප්‍රතිශතය | 52 | 48 | 59 | 41 |

ඉහත විස්තරයට අනුව ආදායම් රැස් කිරීමේ ප්‍රවර්ධනයක් ඇති වන පරිදි නිලධාරීන් ප්‍රධාන කාර්යාලයට හා ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්ත කිරීම සිදු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) බදු ලිපිගොනු සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී බදු ලිපිගොනුවක 2009/2010 තක්සේරු වර්ෂයේ සිට 2012/2013 තක්සේරු වර්ෂය දක්වා වූ තක්සේරු වර්ෂ

04 ක බදු වාර්තාවල සහ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු පිරිවැටුම එකිනෙකට වෙනස් අගයයන් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| තක්සේරු වර්ෂය | පිරිවැටුම | | | |
|---|---|---|---|---|
| | මූල්‍ය ප්‍රකාශන අනුව | VAT වාර්තා අනුව | NBT වාර්තා අනුව | ESC වාර්තා අනුව |
| | රු. | රු. | රු. | රු. |
| 2009/2010 | 1,231,860,939 | 1,272,942,632 | 1,023,942,936 | 1,334,820,418 |
| 2010/2011 | 1,753,586,250 | 1,896,388,595 | 632,099,234 | 1,896,388,636 |
| 2011/2012 | 1,256,996,011 | 1,020,386,941 | 703,262,647 | 299,676,887 |
| 2012/2013 | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොමැත | 965,039,314 | 659,872,084 | 1,058,403,149 |

තවද, 2009/2010 තක්සේරු වර්ෂයේ සිට 2012/2013 තක්සේරු වර්ෂය දක්වා වූ වර්ෂ 04 ක රේගු වාර්තා අනුව ගෙවා තිබුණු ජාතිය ගොඩනැගීමේ බදු මුදල හා මූල්‍ය ප්‍රකාශනවල පෙන්වන ලද බදු මුදල අතර පහත දැක්වෙන වෙනස්කම් අනාවරණය විය.

| තක්සේරු වර්ෂය | රේගු වාර්තා අනුව ආනයන භාණ්ඩ මත ගෙවා ඇති ජාතිය ගොඩනැගීමේ බදු මුදල | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ආනයන භාණ්ඩ මත ගෙවා ඇති ජාතිය ගොඩනැගීමේ බදු මුදල |
|---|---|---|
| | රු. | රු. |
| 2019/2010 | 35,247,968 | 26,568,881 |
| 2010/2011 | 28,081,710 | 21,562,530 |
| 2011/2012 | 16,403,767 | වාර්තා කර නොමැත |
| 2012/2013 | 14,047,925 | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොමැත |

ඉහත සඳහන් නොසැසඳීම් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් සිදුකර අතිරේක බදු අයකර ගැනීමේ හැකියාව සොයා බැලීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ඉ) බදු ලිපිගොනු සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී බදු ලිපිගොණු 03 කට අදාළ වෙළඳ පිරිවැටුම අඩුවෙන් දක්වා තිබුණි. මේ හේතුවෙන් පහත දැක්වෙන පරිදි බදු ආදායම රු.649,395,374 කින් ඌන ගණනය කිරීමක් සිදු කර තිබුණි.

| | කාල පරිච්ඡේදය | බදු වර්ගය | අය විය යුතු අතිරේක බදු මුදල |
|---|---|---|---|
| | | | රු. |
| (i) | 2012/2013 | එකතු කළ අගය මත බදු | 158,236,010 |
| | | ආදායම් බද්ද | 78,630,575 |
| | | ජාතිය ගොඩනැගීමේ බද්ද | 21,892,804 |
| | 2013/2014 | ආදායම් බද්ද | 96,946,239 |
| | | එකතු කළ අගය මත බදු | 211,837,034 |
| | | ජාතිය ගොඩනැගීමේ බද්ද | 24,317,162 |
| (ii) | 2009/2010 | ජාතිය ගොඩනැගීමේ බද්ද | 5,782,969 |
| | | එකතු කළ අගය මත බදු | 36,150,781 |
| | | ආර්ථික සේවා ගාස්තු | 4,003,497 |
| (ii) | 2012/2013 | ආදායම් බදු | 11,598,303 |
| | | **එකතුව** | **649,395,374** |

**3.10** **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1,249 | 1,214 | 35 | - |
| (ii) | තෘතීක මට්ටම | 30 | 29 | 01 | - |
| (iii) | ද්විතීක මට්ටම | 1,058 | 895 | 163 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 409 | 387 | 22 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/කොන්ත්‍රාත් පදනම) | - | 02 | - | 02 |
| | **එකතුව** | **2,746** | **2,527** | **221** | **02** |